**තිරප්පනේ ප්‍රාදේශීය සභාව.**

**2022.11.29 වන දින පෙ.ව 10.00 ට පැවති මහ සභා රැස්වීම.**

***පැමිණ සිටි ගරු මන්ත්‍රීවරුන්:***

1. ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා - ගරු සභාපතිතුමා
2. ඒ.ජී.මරියහාමි මැතිනිය - ගරු උපසභාපතිතුමිය
3. ඒ. අන්වර් සදාක් මැතිතුමා - ගරු සභික තුමා
4. එස්.තිස්ස විජේසිංහ මැතිතුමා - ගරු සභික තුමා
5. එච්.එම්.නාසිම් මැතිතුමා - ගරු සභික තුමා
6. ජී.නිමල් රාජපක්ෂ මැතිතුමා - ගරු සභික තුමා
7. බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා - ගරු සභික තුමා
8. ආර්. ප්‍රියංගන ප්‍රසාද් කුමාර රත්නායක මැතිතුමා - ගරු සභික තුමා
9. ආර්.පී.නිසංසලා ලක්මාලි අබේරත්න මැතිනිය - ගරු සභික තුමිය
10. කේ. නදීකා සෙව්වන්දි කරුණාරත්න මැතිනිය - ගරු සභික තුමිය
11. ජේ.රෝහණ විජේතිලක මැතිතුමා - ගරු සභික තුමා
12. ටී.එම්.තිළිණ රසාංග තිලකරත්න මැතිතුමා - ගරු සභික තුමා
13. ටිකිරි බංඩාර වනසිංහ මැතිතුමා - ගරු සභික තුමා

***නොපැමිණි ගරු මන්ත්‍රීවරුන් :***

1. පී.මධුර කුමාර පියරත්න මැතිතුමා - ගරු සභික තුමා
2. එච්.බී.නලින් හේරත් මැතිතුමා - ගරු සභික තුමා
3. එන්.රශ්මි සංකල්පනා මැතිනිය - ගරු සභිකතුමිය

***සහභාගී වූ නිළධාරීන් ;***

1. ආර්.පී.පී. රේණුකා ලියනගේ මිය - ලේකම්
2. එම්.ආර්.ඩබ්.සී.කේ.රණවීර මිය - විෂය භාර නිලධාරී

**(අ) යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**ලිපි අංක - I .**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

සියළු දෙනාගෙන්ම අවසරයි.2023 වර්ෂය සඳහා අයවැය සම්මත කර ගැනීම සඳහා විශේෂ සභාවක් ලෙස අද දින සභාව පවත්වන්න තීරණය කළා.ඒ වගේම මෙම අය වැය පසුගිය මහා සභාවටත් ඉදිරිපත් කලා.එහිදී යම් යම් සංශෝධනයක් සිදු වූ බැවින් සංශෝධිත අය වැය වාර්තාව ගරු මහ සභාවේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

මේ අනුව 2023 වර්ෂයේ මුළු ආදායම ලෙස රු.43,339,287.00 ක මුදලකුත් ලෙසත් මුළු වියදම ලෙස රු. 43,280,459.00 ක මුදලකුත් අතිරික්තය ලෙස රු.58,828.00 ක මුදලකුත් ලෙස ගණනය කරලා තියෙනවා.ඒ අනුව මෙම අයවැය ඉදිරි වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරිම සඳහා යෝජනා සම්මත කර දෙන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

**යෝජනා අංක 179-11-2022**

**ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා**

2023 වර්ෂය සඳහා අය වැය ලේඛණය ගරු මහ සභාවට ඉදිරිපත් කරලා තියනවා.අපි සභික වරුන් ලෙස අවුරුදු 05ක් මෙම සභාවේ කටයුතු කළා.වෙනත් වසර වල අයවැය සැප්තැම්බර් ඔක්තෝබර් මාස වන විට සම්මත වෙලා නමුත් කුමන හෝ හේතුවක් මත මෙවර අයවැය සම්මත වීම ප්‍රමාද වුණා.මෙය රජයේ ආයතනයක් වගේම මහජන නියෝජිත ආයතනයක්.මම 2002 වර්ෂයේ සිට මන්ත්‍රීවරයෙක් ලෙස මෙම සභාවේ කටයුතු කළා.අවුරුදු 20 පමණ කාලයක සිට මෙම ප්‍රාදේශීය සභාව අඩු ආදායම් ලාභී ප්‍රාදේශිය සභාවක්.කොරෝනා වසංගතයත් අපේ ආදායමට බාධා කළා.සභා වලට කෝටි ගණනක දේපල

පළාත් පාලන ආයතන වලින් ලබලා දීලා තියෙනවා.ඒ වගේම මුදලුත් වෙන් කරනවා.නමුත් අපි තවමත් අඩු ආදායම් ලාභී ප්‍රාදේශීය සභාවක්.අපි ලබන වසරේ ගිහින් මිනිස්සුන්ට මොකද කියන්නනේ? මම හිතන්නේ මෙම සභාවේ ආදායම අඩු වෙන්න හේතු 04ක් තියෙනවා.ඒකෙන් පළවන වග උත්තරකරු ලෙස මන්ත්‍රී මණ්ඩලය වන අපත්,දෙවන වග උත්තරකරු ලෙස සභාපතිතුමත්,තුන්වන විත්තිකරු ලෙස ලේකම්තුමියත් අවසාන වශයෙන් සේවක මණ්ඩලයත් මේ සඳහා වගකිව යුතුයි.ඒ වගේම මේ අය වැය වාර්තාවේ සඳහා ආදායම අඩු වෙලා වියදම් වැඩි වෙන්නත් පුළුවන්.ඒ වගේම අයවැය කියන්නනේ සභාවක හදවත.එබැවින් 2023 වර්ෂය සඳහා සකස් කල අයවැය ලේඛණය සම්මත කිරීමට සුදුසු බව මම යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.</u>

සියළු දෙනාගෙන්ම අවසරයි.මෙම අයවැය තුලින් මහජනතාවට කිසිම මුදලක් වෙන් කරලා නෑ.සෞඛ්‍ය ක්ෂේත්‍රයට පොඩි මුදලක් වෙන් කරලා තියෙන්න.සෞඛ්‍ය සායනයක්වත් පවත්වලා නෑ.ව්‍යාපෘති මත පාරවල් ඉදිකිරීම පමණයි සිදු වුනේ.ඒවත් අවුරුදු 05ක් යනකොට කැඩෙනවා.අපි සැලසුම් ඉදිරිපත් කලත් ඒවා තාමත් ක්‍රියාත්මක වුවේ නෑ.වී මෝලක්,බොරළු වලක් කරමු කිව්වට මේ වන විටත් ක්‍රියාත්මක වුනේ නෑ.තුරු සෙවණ සහ පාර්ක් එකේ ආදායම මේකට ඇතුලත් කරලා නෑ.මෙම අයවැය සම්බන්ධයෙන් මම මාගේ පෞද්ගලික විරෝධතාවය ප්‍රකාශ කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා සභික -ඒ. අන්වර් සදාක් මැතිතුමා.</u>

සියළු දෙනාගෙන්ම අවසරයි.තිස්ස මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ පරිදි අඩු ආදායම් ලාභී සභාවක් වීම සම්බන්ධයෙන් අපි සියළු දෙනාම වගකිව යුතුයි.එබැවින් 2023 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අයවැය ලේඛණය ක්‍රියාත්මක කිරීමට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරනවා.

<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>

රෝහණ මන්ත්‍රිතුමා තුරු සෙවණ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් මතු කළා.අපි තුරු සෙවණ සහ පාර්ක් එකේ ආදායම අයවැය කෙටුම්පතට ඇතුලත් කරලා තියෙන්නේ.

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව ගරු ප්‍රාදේශීය සභා සභික ජේ.රෝහණ විජේතිලක මැතිතුමා පෞද්ගලික විරෝධතාවය ප්‍රකාශ කළ අතර පැමිණ සිටි බහුතර සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

<u>ලිපි අංක - **II .**</u>

<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>

වීථි පහන් උපකරණ මිල දී ගැනීම සඳහා විෂය භාර නිලධාරිතුමිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහා සභාවේ සුදුසු තීරණයක් ගැනීමට ඉදිරිපත් කර සිටිනවා.

<u>යෝජනා අංක **180-11-2022**</u>

<u>ගරු ප්‍රාදේශීය සභා සභික -ඒ. අන්වර් සදාක් මැතිතුමා.</u>

ලබන වසර සඳහා වීථි ලාම්පු මිල දී ගැනීමට මිල ගණන් කැඳවීමට සුදුසු බවට මම යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා සභික - එච්.එම්.නාසිම් මැතිතුමා.</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව ස්ථිර කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා සභික - තිළිණ රසාංග තිලකරත්න මැතිතුමා.</u>

වන අලි ප්‍රශ්ණය මාගේ කොට්ඨාශයටත් තියනවා.මෙතෙක් කලක් මට නිරීක්ෂණය වුනේ වන අලි ප්‍රශ්ණය පවතින නිවාස ආශ්‍රිතව නොව පාක්ෂිකයන්ගේ නිවාස ආශ්‍රිතව වීථි පහන් සවි කල බවටයි.එබැවින් මේ පිළිබඳවද අවධානය යොමු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක - III .</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

තිරප්පනේ ප්‍රාදේශීය සභාව සතු RD-4325 අංක දරණ ටැක්ටර් රථය සඳහා නව බැටරියක් මිල දී ගැනීම සඳහා රියදුරු විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහා සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

**<u>යෝජනා අංක 181–11-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ. අන්වර් සදාක් මැතිතුමා.</u>**

RD-4325 අංක දරණ ටැක්ටර් රථය සඳහා නව බැටරියක් මිල දී ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක - IV .</u>**

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

තිරප්පනේ ප්‍රාදේශීය සභාව සතු RD-7335 අංක දරණ ටැක්ටර් රථය සඳහා නව බැටරියක් මිල දී ගැනීම සඳහා රියදුරු විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහා සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

**<u>යෝජනා අංක 182-11-2022</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ. අන්වර් සදාක් මැතිතුමා.</u>**

RD-4325 අංක දරණ ටැක්ටර් රථය සඳහා නව බැරියක් මිල දී ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - නිමල් රාජපක්ෂ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>(ආ) නොපැමිණෙන මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අවසර ලිපි ඉදිරිපත් කිරිම.</u>**

කිසිවක් නැත.

**<u>(ඇ) ගරු සභිකවරුන්ගේ වෙනත් අදහස් ඉදිරිපත් කිරිම.</u>**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

තිළිණ මන්ත්‍රීතුමා වීථි ලාම්පු ප්‍රශ්ණයක් සම්බන්ධයෙන් ප්‍රකාශයක් ඉදිරිපත් කලා.මෙම වසරේ මුදල් නොමැතිකම නිසා පෞද්ගලිකව අරන් දුන්න අයට තමයි වීථි ලාම්පු සවි කරලා දුන්නේ.ඔබතුමාට යම්කිසි අසාධාරණයක් වෙන්න ඇති.මම ඒ පිළිබඳව සමාව ඉල්ලනවා.අද දිනයේ විදුලි කාර්මික සභාවේ රැඳී සිටින බැවින්,ඔබතුමාට යම් සහායක් අවශ්‍ය නම් ලබා ගන්නා ලෙස මම ඉල්ලා සිටිනවා.මම සභාව භාර ගන්න කොට යන්ත්‍ර සූත්‍ර කිසිවක් තිබුනේ නෑ.අද වන විට වාහන විශාල ප්‍රමාණයක් ලබා ගත්තා.විශේෂයෙන්ම මම භාවිතා කරන කැබ් රථය එහෙම ලැබුන වාහනයක්.ඒ වගේම මම ආමාත්‍යාංශය හරහා මෙන්ම පළාත් සභාව හරහා ද ව්‍යාපෘති ගෙන්න ගත්තා.ඒ වගේම තුරු සෙවණ සහ භූ දර්ශන ව්‍යාපෘතිත් නාගරික සංවර්ධන අධිකාරිය සමඟ පැවති සම්බන්ධතාවය මත අපි සිදු කලා.එබැවින් මේ පිළිබඳව ධනාත්මකවත් සිතන ලෙස මම ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

රෝහණ මන්ත්‍රීතුමා ගෙනා ප්‍රශ්නයට මම පිළිතුරක් දෙන්නම්.මට සුළු කාලයක් ලබා දෙන්න.එබැවින් මෙම සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - නදීකා සෙව්වන්දි කරුණාරත්න මැතිණිය.**

කාරක සභා අවස්ථාවක් බවට පත් කිරීම සඳහා ගෙනා යෝජනාව ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

කාරක සභාවක් අවස්ථාවක් බවට පත් කරන ලද සභාව මහ සභාවක් බවට පත් කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - නදීකා සෙව්වන්දි කරුණාරත්න මැතිණිය.**

කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීම සඳහා ගෙනා යෝජනාව ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

රෝහණ මන්ත්‍රීතුමා කඩ කාමර බදු දීම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් මතු කලා.නිවාස කමිටුවේ සියළු දෙනාම එකතු වෙලා හිඟ බදු මුදල් අය කරලා දුන්නා.ඒ සම්බන්ධයෙන් සියළු දෙනාටම ස්තූතිවන්ත වෙනවා.අපේ සභාවේ සම්පත් අපි ආරක්ෂා කල යුතුයි.ඇතුන්ගම ප්‍රදේශයේ අක්කර 02ක් සහ දයාගම ප්‍රදේශයේ අක්කර 0.5ක් සභාව සතු ඉඩම් වශයෙන් පැවතුනා.දැනට එයින් භාගයක්වත් ඉතුරු වෙලා නෑ.ගල්කුලමෙත් එහෙමයි.ඒවාට වැටක් ගහන්න බැරිවුණා.

තුරු සෙවණ බදු දීමට ටෙන්ඩර් පටිපාටියට සිදු කරන තුරු 2022 වර්ෂයේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන යටතේ පුද්ගලයන් තිදෙනෙක් ඉල්ලුම් කරලා තිබුනා.එයින් දෙදෙනෙක් ව්‍යාපාරික මහතුන් දෙදෙනෙක් වන අතර එක් අයෙක් කාන්තාවකි.ඒ අනුව කාන්තාවන් දිරිමත් කිරීමේ අරමුණින් එය ඇය හට ලබා දුන්නා.මාසිකව මුදල් අය කර ගැනිමට එකඟ වූවත් මෙම මාසයේදී මේ වන තුරු අදාල මුදල් ලබා  දී නෑ.ඇප තැන්පත් මුදල මේ වන විට ලබා දී නොමැත.එබැවින මෙම මස 30 වන විට අදාල මුදල් ගෙවීම පැහැර හැරිය හොත් දෙවන ඉල්ලුම්කරුට ටෙන්ඩරය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.සභාව පැත්තෙන් හිතලා තමයි මම මේ යෝජනාව ගෙනාවේ.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජයතිලක මැතිතුමා.**

ඉහත ගෙන ආ යෝජනාව ස්ථිර කරමි.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

ඒ අනුව අද දින විශේෂ මහ සභාවට පැමිණි සියළු දෙනාටම බෙහෙවින් ස්තූතිවන්ත වන අතර අයවැය සැකසීම සඳහා දායක වූ සියළු දෙනාටම ස්තූතිවන්ත වෙමින් ගරු මහ සභාවේ කටයුතු මෙයින් හමාර කරනවා.

2022.11.29 වන දින පැවති ගරු මහ සභාවේ වැඩ කටයුතු පෙ.ව 11.10ට පමණ අවසන් විය.